# දරුවන් උදෙසා
# බයිබලයක්



## දෙවරක් ජීවත් වූ දැරිය

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Janie Forest
Alastair Paterson

සකස්කරන්නා: Ruth Klassen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2025 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

ජායිරස්, දෙවියන් වහන්සේට නමස්කාර කළ සහ අන් අයට දේව වචනය ඉගැන්වූ යුදෙව් ආගමික නායකයෙකු වූයේය. දිනක් ජායිරස්ට දරුණු කරදරයක් පැමිණියේය. අවුරුදු දොළහක් වයසැති ඔහුගේ ආදරණීය දියණිය අසනීප වූවාය. කිසිවෙකුට ඇයට උදව් කළ නොහැකි බව පෙනෙන්නට තිබුණි. එය දරුණු අසනීපයක් විය. දැරිය මියයමින් සිටින බව ජායිරස් දැන සිටියේය.



ජායිරස්ගේ දියණියට උදව් කළ හැක්කේ එක් පුද්ගලයෙකුට පමණි. ජායිරස් ජේසුස් වහන්සේ සොයාගෙන ඔහුගේ නිවසට කැඳවාගෙන ඒම සඳහා පිටත් වූයේය. ඔහුගේ සෙසු ආගමික නායක මිතුරන් ජේසුස් වහන්සේව අනුමත නොකරන බව ජායිරස් දැන සිටියා විය හැකිය.



නමුත් ජායිරස් එය ගණන් නොගත්තේය. ඔහුගේ දියණිය මිය යාමට පෙර ඔහුට ඉක්මනින් උපකාර ලබා ගැනීමට සිදුවී තිබුණි.



ජේසුස් වහන්සේව මිනිසුන් විසින් වට කරගෙන සිටිනු ජායිරස් දුටුවේය.

ඔහු ජේසුස් වහන්සේගේ පාමුල දණින් වැටුණේය. “මගේ කුඩා දියණිය මරණාසන්නව සිටියි” බලාපොරොත්තු සුන් වූ මිනිසා බැගෑපත් වූයේය. “ඇවිත් සුව වන පිණිස ඇය පිට අත් තබනු මැනව, එවිට ඇය ජීවත් වනු ඇත.”



ජේසුස් වහන්සේ ජායිරස්
සමඟ ගිය සේක. නමුත්
බොහෝ සෙනඟ නිසා ඔවුන්ට
ඉක්මනින් ගමන් කිරීමට
නොහැකි විය. එක්
කාන්තාවක් වසර දොළහක්
පුරා දැඩි ලෙස රෝගාතුරව
සිටියාය. ඇය උපකාර ලබා
නොගෙන සියලු වෛද්යවරුන්
වෙත ගොස් (ඇගේ සියලු මුදල්
වියදම් කර) තිබුනත්
උපකාරයක් නොලැබ සිටියාය.
අහෝ! ඇයට ජේසුස්
වහන්සේව දැකීමට තිබුන
වුවමනාවේ තරම!



ඒ කාන්තාවට කුමක් කළ හැකි
වේවිද? “මට උන්වහන්සේගේ
ඇඳුම් ඇල්ලුවත් මාව සනීප වේවි”
කියා කාන්තාව මිමිණුවාය. ඇය
ජේසුස් වහන්සේ දෙසට ගමන්
කළාය. ඉන්පසු ඇය තම අත දිගු
කර ජේසුස් වහන්සේගේ
සළුව ස්පර්ශ කළාය.



ආශ්චර්යයක්! හාස්කමක්!
කාන්තාව සුවපත් වූවාය. ඒ
මොහොතේම සම්පූර්ණයෙන්ම
ඇය සුවපත් වූවාය. ඇය
සම්පූර්ණයෙන් සුව වූ බවත්,
ශක්තිමත් වූ බවත්  ඇය
දැනගත්තාය. එවිටම හඬක්
ඇසුණි. "මා ස්පර්ශ කළේ
කවුද?" ජේසුස් වහන්සේ ඇසූ
සේක. බොහෝ සෙනඟ උන්
වහන්සේව ස්පර්ශ කළො◌්ය.
නමුත් සුවය ලැබූ කාන්තාව
ඇය ගැන උන්වහන්සේට
පැවසිය යුතු බව දැන සිටියාය.
බියෙන් ඇය තම මුළු කතාවම
උන්වහන්සේට කීවාය.



එවිටම ජායිරස්ගේ නිවසින්
සේවකයෝ පැමිණියෝය.
ඔවුන් කතා කිරීමටත් පෙර
ඔවුන්ගේ මුහුණු, සිදුවී ඇති
දුක්බර කතාව කීවා විය
හැකිය. "ඔබේ දියණිය මිය
ගියාය!" ඔව්හු ජායිරස්ට
කීවෝය. මිය ගිහින්! දැන්
ප්‍රමාද වැඩිය. සමහරවිට
රෝගීව සිටි කාන්තාව ගමන
ප්‍රමාද නොකළේ නම්...
කෙසේ වුවත් දැන් ඇය මිය
ගොසිනි! ජායිරස්ගේ කුඩා
දැරිය තව දුරටත් ජීවතුන්
අතර නොමැත.

ජේසුස් වහන්සේ එය ඇසූ විට, “බිය නොවන්න, විශ්වාස කරන්න, එවිට ඇය සුවපත් වනු ඇත” යි පිළිතුරු දුන් සේක. සැබවින්ම ජේසුස් වහන්සේව විශ්වාස කරන්න ජායිරස්ට මොනතරම් නම් අසීරු වන්නට ඇද්ද? ඔහුගේ දියණිය මිය ගොසිනි.



නිවසේ සියල්ලෝම දැරිය වෙනුවෙන් හඬා වැලපුණෝය.
“ඇය මියගොස් නැත, නිදා සිටින්නීය” කියා ජේසුස් වහන්සේ ඔවුන්ට පැවසූ සේක. ඔව්හු උන් වහන්සේට සිනාසුනෝය.

දැරිය මිය ගිය බව ඔවුහු දැන සිටියෝය.



ජේසුස් වහන්සේ සියලු දෙනාවම නිවසින් පිටතට යවා,
දැරියගේ අත අල්වා “කුඩා දැරිය, නැගිටින්න යැ” යි කීසේක.
ජායිරස් එහි සිටියේය. ඔහුගේ බිරිඳ එහි සිටියාය. ජේසුස්
වහන්සේගේ ගෝලයන් තුන්දෙනෙක්
එතැන සිටියෝය. ඔවුන්
සියලුදෙනාටම ජේසුස්
වහන්සේගේ වචන ඇසුණි.
මියගිය කුඩා දැරියටත්
ඒවා ඇසේවිද?



මියගිය දැරියට ජේසුස්
වහන්සේගේ අණ
කිරීම ඇසුණේය!
ඇයගේ ආත්මය
නැවත පැමිණි
අතර ඇය
එකිණෙහිම
නැඟිට සිටියාය.
ජේසුස්
වහන්සේ
ඇයව
මළවුන්ගෙන්
උත්ථාන
කළ සේක.



දැරියගේ දෙමව්පියෝ මවිතයට පත් වූවෝය. දැරියට කෑමට යමක් දෙන්න කියා ජේසුස් වහන්සේ ඔවුන්ට කීසේක. ඔවුන්ට මොනතරම් සතුටක් දැනෙන්නට ඇද්ද? ජේසුස් වහන්සේට කොතරම් ස්තූතිවන්ත වන්නට ඇද්ද?

උන්වහන්සේගේ
පුදුමාකාර ආදරය
සහ බලය
ඔවුන්ගේ
දියණිය
මරණයෙන්
නැවත
ජීවනයට
ගෙන ආවේය.



# දෙවරක් ජීවත් වූ දැරිය

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ශු. මාක් 5, ශු. ලූක් 8

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130

# අවසානය

49

60

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සැදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)